# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## 1996 අංක 27 දරන

## ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත

---


[සහතිකය සටහන් කළේ 1996 ඔක්තෝබර් මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1996 ඔක්තෝබර් මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 140.00.

[සහතිකය සටහන් කළේ 1996 ඔක්තෝබර් මස 23 වන දින]

එල්. ඩී.–ඕ. 14/96

**1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

1991 අංක 25 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ දීර්ඝ නාමයේ, "විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කිරීම" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පිහිටුවීම" යන වචන ආදේශ කිරීමෙන්, ඒ දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන කොටසේ ශීර්ෂ පාඨය ප්‍රතියෝජනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට පෙරාතුව ම, වූ 1 වන කොටසෙහි දැක්වෙන ශීර්ෂ පාඨය මෙයින් ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන අලුත් ශීර්ෂ පාඨය ආදේශ කරනු ලැබේ :—

"ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පිහිටුවීම සහ එහි සංයුතිය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පිහිටුවීම

2. (1) (මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව යනුවෙන් හැඳින්විය යුතු කොමිෂන් සභාවක් පිහිටුවනු ලබන අතර, මේ පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ තත් කාලයේ කොමිෂන් සභාවේ සාමාජිකයන් වන තැනැත්තන්ගෙන් එය සමන්විත විය යුතුය.

(2) කොමිෂන් සභාව, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, එයට, අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද, ඒ නාමයෙන් එය විසින් නඩු පැවරීම ද ඊට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"කොමිෂන් සභාවේ සංයුතිය.

3. (1) කොමිෂන් සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :-

(අ) කොමිෂන් සභාවේ සභාපති විය යුතු, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් ;

(ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් තත් කාලයේ ධුරය දරන තැනැත්තා ; සහ

(ඇ) පිළිගත් සුදුසුකම් ඇත්තා වූ සහ පිළිවෙලින් නීති, මුදල් සහ කළමනාකරණ ක්ෂේත්‍රවල විශිෂ්ටතාවක් ලබා ඇත්තා වූ ද තැනැත්තන් අතුරින් (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙක්.

(2) කොමිෂන් සභාවේ පත් කළ සාමාජිකයන්, සම්බන්ධයෙන්, මේ පනතේ උපලේඛනයේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3අ, 3ආ, 3ඇ සහ 3ඈ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ඒ ප්‍රඥප්තියේ 3අ, 3ආ, 3ඇ සහ 3ඈ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :—



"කොමිෂන් සභාවේ ගණපූරණය සහ රැස්වීම්.

3අ (1) කොමිෂන් සභාවේ රැස්වීමක ගණපූරණය සාමාජිකයන් තිදෙනකු විය යුතු අතර කොමිෂන් සභාවේ සභාපති ඔවුන් අතුරින් කෙනකු විය යුතු ය.

(2) කොමිෂන් සභාවේ රැස්වීමක මූලසුන සභාපති හෝ ඔහු නොපැමිණි විටෙක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෙබවිය යුතු ය.

(3) කොමිෂන් සභාවේ යම් රැස්වීමක දී තීරණය කිරීම සඳහා වන සියලු ප්‍රශ්න, ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජික බහුතරයේ ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ ඉහතින් ම වූ විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල දී කටයුතු කිරීම පිළිබඳ කාර්ය පරිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

යම් දෝෂයක් තිබුණේ වුව ද වලංගු භාවය.

3ආ. කොමිෂන් සභාවේ කිසිම ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක්, එහි යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් අවලංගු වන ලෙස සලකනු නොලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

3ඇ. මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට සහ යම් අනුප්‍රමාණ අනුව, කොමිෂන් සභාවේ අරමුදලින් කොමිෂන් සභාවේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

3ඈ. (1) කොමිෂන් සභාවේ මුද්‍රාව :—

කොමිෂන් සභාවේ මුද්‍රාව.

(අ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබ, සකස් කළ යුතු අතර, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට වෙනස් කළ හැකි ය ;

(ආ) කොමිෂන් සභාව විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි යම් තැනැත්තකු භාරයේ තිබිය යුතු ය : තව ද,

(ඇ) කොමිෂන් සභාවේ අනුමතය ඇතිව හැර, සහ කොමිෂන් සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තබනු නොලැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාමාජිකයන් දෙදෙනාම, ඒ සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ මුද්‍රාව තැබූ සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳ රෙජිස්ටරයක් කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යා යුතු ය.".

"බලධරයා" සම්බන්ධයෙන් කරනු ලබන සඳහන "කොමිෂන් සභාව" සම්බන්ධයෙන් කරනු ලබන සඳහනක් ලෙස තේරුම් ගැනීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ සහ යම් රීතියක, දැන්වීමක, නිවේදනයක, සාධන පත්‍රයක හෝ වෙනත් ලේඛනයක "බලධරයා" සම්බන්ධයෙන් කරනු ලබන සෑම සඳහනක් ම, "කොමිෂන් සභාව" සම්බන්ධයෙන් කරනු ලබන සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (ඊ) ඡේදයෙහි "කලින් කල බලධරයාට දෙනු ලබන" යන වචන වෙනුවට, "කලින් කල කොමිෂන් සභාවට දෙනු ලබන" යන වචන ආදේශ කිරීමෙන් :

(2) ඒ වගන්තියේ (එ) ඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(එ) ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, විදුලි සංදේශ ක්‍රමයක් පිහිටුවීම සඳහා ප්‍රමිති හා කාර්ය පරිපාටි සම්බන්ධයෙන් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය, වෙනත් විදේශීය විදුලි සංදේශ ක්‍රියාකරුවන් සහ



ජාත්‍යන්තර විදුලි සංදේශ සංවිධාන සමග ගිවිසුම් ඇති කර ගැනීම පිණිස සාකච්ඡා පැවැත්වීමේ දී යම් අමාත්‍යාංශයකට සහායවීම ;";

(3) ඒ වගන්තියේ (ඔ) ඡේදයෙහි "අමාත්‍යවරයා" යන වචනයේ සිට "නිශ්චය කිරීම :" යන වචන දක්වා වූ කොටස ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්–

"අමාත්‍යවරයා විමසා, ආණ්ඩුවේ ප්‍රතිපත්තිය සහ ක්‍රියාකරුවන් විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් සම්බන්ධයෙන් ක්‍රියාකරුවන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, ගාස්තු ක්‍රම හෝ ගාස්තු ක්‍රම තීරණය කිරීමේ ක්‍රම නිශ්චය කිරීම :";

(4) ඒ වගන්තියේ (ග) ඡේදයෙහි "තමා වෙත" යන වචන වෙනුවට, "එය වෙත" යන වචන ආදේශ කිරීමෙන් ;

(5) ඒ වගන්තියේ (ත) ඡේදයෙහි "තමාගේ බලතල හා කාර්යය" යන වචන වෙනුවට "ස්වකීය බලතල සහ කාර්ය" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(6) ඒ වගන්තියේ (බ) ඡේදයෙහි "ඔහුගේ බලතල ක්‍රියාත්මක කිරීමට හෝ කාර්ය ඉටුකර ගැනීමට" යන වචන වෙනුවට, "එහි බලතල ක්‍රියාත්මක කිරීමට හෝ කාර්ය ඉටු කර ගැනීමට" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය, "බලධරයා සතු බලතල" යන වචන වෙනුවට, "කොමිෂන් සභාව සතු බලතල" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (ආ) ඡේදයෙහි "තම බලතල" යන වචන වෙනුවට, "ස්වකීය බලතල" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "අවශ්‍යයයි බලධරයා සලකන විමර්ශනයක්" යන වචන වෙනුවට, "අවශ්‍යයයි කොමිෂන් සභාව සලකන විමර්ශනයක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "බලධරයාට පෙනී යන" යන වචන වෙනුවට, "කොමිෂන් සභාවට පෙනී යන" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "අවශ්‍ය යයි බලධරයා සලකන" යන වචන වෙනුවට, "අවශ්‍ය යයි කොමිෂන් සභාව සලකන" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ :—

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයෙහි "තමා අදහස් කරන" යන වචන වෙනුවට, "එය අදහස් කරන" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයෙහි "තම මතය අනුව" යන වචන වෙනුවට, "කොමිෂන් සභාවේ මතය අනුව" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි (අ) ඡේදයෙහි "ප්‍රත්‍යාදිෂ්ට කිරීමට තමා අදහස් කරන" යන වචන වෙනුවට, "ප්‍රත්‍යාදිෂ්ට කිරීමට එය අදහස් කරන" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියෙහි (අ) ඡේදයෙහි "උචිත වන්නේ යයි බලධරයා සලකන" යන වචන වෙනුවට, "උචිත වන්නේ යයි කොමිෂන් සභාව සලකන" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) කොමිෂන් සභාව වෙත කරන ලද කරුණු සැල කිරීම් අනුව හෝ නොඑසේව, කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමට හෝ යෝජිත ක්‍රියාත්මක කිරීමට අදාළ යම් කාරණාවක් පිළිබඳව විමර්ශනයක් පැවැත්වීම හෝ තීරණය කිරීම පොදු යහපත පිණිස අවශ්‍ය බව කොමිෂන් සභාව සලකන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් සිය මෙහෙයීමෙන් ම ප්‍රසිද්ධ විභාගයක් පවත්වනු ලැබිය හැකි ය.";



(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "බලධරයාගෙන්" "බලධරයා විසින්" සහ "බලධරයා" යන වචන වෙනුවට පිළිවෙලින් "කොමිෂන් සභාවේ සභාපතිගෙන්", "එකී සභාපති විසින්" සහ "එකී සභාපති" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ "ඔහු විසින් සහතික කරන ලද" සහ "බලධරයාගේ හෝ ඒ සාමාජිකයාගේ අත්සන" යන වචන වෙනුවට, පිළිවෙලින් "එය විසින් සහතික කරන ලද" සහ "කොමිෂන් සභාවේ සභාපතිගේ හෝ ඒ සාමාජිකයාගේ අත්සන" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ –

(අ) (අ) ඡේදයෙහි "බලධරයා විසින් සුදුසු යයි තමා සලකන" යන වචන වෙනුවට, "කොමිෂන් සභාව විසින් සුදුසු යයි එය සලකන" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) (ආ) ඡේදයෙහි (i) වන අනුඡේදයෙහි "තමා අදහස් කරන බව" යන වචන වෙනුවට, "කොමිෂන් සභාව අදහස් කරන බව" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "බලධරයා සෑහීමට පත්විය යුතු ය." යන වචන වෙනුවට, "කොමිෂන් සභාව සෑහීමට පත්විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (7) වන උපවගන්තියේ –

(අ) (ආ) ඡේදයේ "පවතින අතරතුර බලධරයා විසින් දරනු ලබන" යන වචනවල සිට "වාර්ෂික ගෙවීම් බද්දක් බලධරයා වෙත" යන වචන තෙක් වූ

සියලු වචන වෙනුවට, "පවතින අතරතුර බලපත්‍රය දීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් දරනු ලබන වියදම් ගෙවීම පිණිස කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණයක් හෝ මුදල් ප්‍රමාණ කොමිෂන් සභාව වෙත" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) (ඇ) ඡේදයෙහි "බලධරයාගේ කාර්ය" යන වචන වෙනුවට, "කොමිෂන් සභාවේ කාර්ය" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ (9) වන උපවගන්තියේ "ඒකාබද්ධ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "මේ පනතේ 22ඊ වගන්තිය මගින් පිහිටුවනු ලද කොමිෂන් සභාවේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "බලධරයා අදහස් කරන්නේ නම්, ඔහු විසින්," යන වචන වෙනුවට "කොමිෂන් සභාව අදහස් කරන්නේ නම් එය විසින්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 18අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"ව්‍යාපාරික කටයුතු සඳහා යම් තැනැත්තකුට විදුලි සංදේශ ක්‍රමය භාවිතා කිරීමට අවසර දීම ක්‍රියාකරුට තහනම් කිරීම.

18අ. (1) විදුලි සංදේශ ක්‍රමය සම්බන්ධයෙන්, බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති ක්‍රියාකරුවකු විසින්, කොමිෂන් සභාවේ පූර්ව අනුමතය නොලබා, ගාස්තුවක් හෝ ත්‍යාගයක් ගෙවීම මත, ව්‍යාපාරයක ආකාරයෙන්, පණිවුඩ යැවීමේ හෝ ලබා ගැනීමේ කාර්යය සඳහා ඒ විදුලි සංදේශ ක්‍රමය භාවිත කිරීමට, වෙනත් යම් තැනැත්තකුට අවසර දෙනු නොලැබිය යුතු ය.

(2) ක්‍රියාකරුවකු විසින් ඒ සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට, (1) වන උපවගන්තියේ කාර්යය සඳහා ක්‍රියාකරු වෙත අවසර පත්‍රයක්



නිකුත් කිරීමෙන් කොමිෂන් සභාව විසින් අනුමතය දෙනු ලැබිය යුතු ය. අවසර පත්‍රය එහි සඳහන් නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රය, එය යටත් කෙරුණු නියම සහ කොන්දේසි කිසිවක් කඩ කරනු ලැබූ විට, කොමිෂන් සභාව විසින් කවර විටක දී වුව ද අවලංගු කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය කඩ කරමින් ක්‍රියාකරන යම් ක්‍රියාකරුවකු, වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් දස දහසකට නොඅඩු දඩයකට යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ
(අ) ඡේදයෙහි :—

(අ) ඒ ඡේදයේ (ii) වන අනුඡේදය වෙනුවට පහත දක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් –

"(ii) විදුලි සංදේශ ක්‍රමයට අඩංගු සියලු උපකරණ–

(අ) අයිතිකරුගේ හෝ කුලී නිවැසියාගේ තනි ප්‍රයෝජනය සඳහා තනි අයිතියක් ඇති හෝ කුලියට දී ඇති ස්ථානයක සහ යාබද මායිමක් ඇතුළත පිහිටි ; හෝ

(ආ) වාහනයක්, යාත්‍රාවක, ගුවන් යානයක හෝ හවර් යානයක හෝ යාන්ත්‍රිකව එකට ඈඳ ඇති වාහන, යාත්‍රා, ගුවන් යානා හෝ හවර් යානා දෙකක හෝ වැඩි ගණනක පිහිටි සහ වෙනත් විදුලි සංදේශ ක්‍රමයකට සම්බන්ධ කර නොමැති විදුලි සංදේශ ක්‍රමයක් ; හෝ" ;

(ආ) ඒ ඡේදයේ (iii) වන අනුඡේදයේ "යම් විදුලි සංදේශ ක්‍රමයක් තනි පුද්ගලයකු ක්‍රියාත්මක කරන ; සහ" යන වචන වෙනුවට, "වෙනත් විදුලි සංදේශ ක්‍රමයකට සම්බන්ධ නොකරන ලද සහ තනි පුද්ගලයකු විසින් ක්‍රියාත්මක කරනු ලබන විදුලි සංදේශ ක්‍රමයක් ; සහ " යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි (අ) ඡේදයෙහි "(1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් " යන වචන වෙනුවට, "(1) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි සඳහන්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි "(1) වන උපවගන්තියේ (අ) (iii) හෝ (ඇ) ඡේදයේ සඳහන්" යන වචන වෙනුවට, "(1) වන උපවගන්තියේ (අ) (iii) හෝ (ඇ) ඡේදයෙහි සඳහන්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට, පහත දක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) කිසිම තැනැත්තකු විසින් යම් විදුලි සංදේශ උපකරණයක් වෙළඳාමක් වශයෙන් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීම පිණිස ඉදිරිපත් කිරීම, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම, පැවරීම, කුලියට දීම, බදුදීම, ක්‍රියාකර පෙන්වීම, නඩත්තු කිරීම හෝ අලුත්වැඩියා කිරීම කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ හැර, කරනු නොලැබිය යුතු ය. මේ උපවගන්තිය යටතේ බලපත්‍රයක් සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක්, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකෘතියක කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය." ;



(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ –

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයෙහි "අත්සන යොදා දිය යුතු ය." යන වචන වෙනුවට, "අත්සන යටතේ විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට, පහත දක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) කොමිෂන් සභාව විසින් ඒ සඳහා සාදන ලද රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ගාස්තුවක් ගෙවූ විට නිකුත් කළ යුතු ය : තවද";

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර, ඔහු විසින්" යන වචන වෙනුවට, "අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර, එය විසින්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21**. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට, පහත දක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) කිසිම තැනැත්තකු විසින්, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකා දේශීය ජලතීරයේ යම් කොටසක හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද යම් නැවක හෝ ගුවන් යානයක යම් ගුවන් විදුලි සංඥාතයක් හෝ යම් ගුවන් විදුලි සංඥාත විමෝචන උපකරණයක් භාවිත කිරීම, තත් කාර්ය සඳහා (2) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ හැර, කරනු නොලැබිය යුතු ය. මේ වගන්තිය යටතේ බලපත්‍රයක් සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් ම, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකෘතියක කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ–

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට, පහත දක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) කොමිෂන් සභාවේ හෝ කොමිෂන් සභාව විසින් තත් කාර්යය සඳහා බලය දෙන ලද යම් නිලධරයකුගේ, මුද්‍රාව යටතේ නිකුත් කරනු ලැබිය යුතු ය.";

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) කොමිෂන් සභාව විසින් තත් කාර්යය සඳහා සාදන ලද රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ගාස්තුවක් ගෙවනු ලැබූ විට නිකුත් කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, මේ උපවගන්තිය යටතේ වූ බලපත්‍රයක්, කොමිෂන් සභාව විසින්–

(i) ශ්‍රී ලංකාවේ යම් විදේශ තානාපති දූත පිරිසකට ;

(ii) එක්සත් ජාතීන්ගේ නියෝජ්‍යායතනයකට ;

(iii) කොමිෂන් සභාව විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් ජාත්‍යන්තර නියෝජ්‍යායතනයකට හෝ සංවිධානයකට ; හෝ

(iv) ස්වකීය නිල කටයුතු කිරීමේ දී, පොලිසියට, සන්නද්ධ හමුදාවලට හෝ ජාතියේ ආරක්ෂාව සඳහා කෙළින් ම රජයේ සේවයේ නියුක්ත කරනු ලැබ ඇති වෙනත් සේවාවලට

ඒ ගාස්තුව ගෙවීමක් නොමැතිව නිකුත් කරනු ලැබිය හැකි ය.";

(ඇ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයෙහි "නියමිත සංඛ්‍යාත උපකරණ පාවිච්චි කිරීම" යන වචන වෙනුවට, "මුද්‍රා තැබීම ද ඇතුළුව යම් ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණ භාවිතය" යන වචන ආදේශ කිරීමෙන් ;



(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා" සහ "ඔහු විසින්" යන වචන වෙනුවට, පිළිවෙළින් "අභියාචනාධිකරණය" සහ "එය විසින්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ පැති සටහන වෙනුවට, පහත දක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන් :—

"යම් ගුවන් විදුලි සංඛ්‍යාතයක් හෝ ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණයක් භාවිත කිරීම සඳහා බලපත්‍රය.".

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 22අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියේ 22අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"කේබල් ඇදීමේ වැඩ කිරීම සඳහා බලපත්‍රය.

22අ. (1) යම් ස්ථානයක කේබල් ඇදීමේ වැඩ කිරීම, ඒ කාර්යය සඳහා (2) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ හැර කිසිම තැනැත්තකු විසින් කරනු නොලැබිය යුතු ය. මේ වගන්තිය යටතේ බලපත්‍රයක් සඳහා කරනු ලබන සෑම ඉල්ලීමක් ම, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකෘතියක කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් :—

(අ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකෘතියක සහ යම් ගාස්තුවක් ගෙවනු ලැබූ විට නිකුත් කරනු ලැබිය යුතු ය ;

(ආ) ඒ බලපත්‍රයේ සඳහන් කරනු ලැබිය හැකි යම් නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු ය ; තව ද

(ඇ) කොමිෂන් සභාව විසින් තත් කාර්යය සඳහා සාදන ලද රීති මගින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි තාක්ෂණික ප්‍රමිතිවලට අනුකූලව තිබිය යුතු ය.

(3) බලපත්‍රයේ නියම හා කොන්දේසි කිසිවක් කඩ කිරීමේ දී හෝ බලපත්‍රලාභියා විසින් අනුකූලව කටයුතු කළ යුතු යයි නියමිත තාක්ෂණික ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හැරීමේ දී මේ වගන්තිය යටතේ දෙන ලද යම් බලපත්‍රයක් කොමිෂන් සභාව විසින් කවර විටක දී වුව ද ප්‍රත්‍යාදිෂ්ට කර අවසාන කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් සඳහා කරන ලද ඉල්ලීමක් කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නා වූ හෝ (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක්, ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන්නා වූ හෝ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරු හෝ බලපත්‍රලාභියා විසින්, කොමිෂන් සභාවේ තීරණය තමා වෙත දැනුම් දෙන ලද දිනයෙන් පසු එක් මාසයක් ඇතුළත, අවස්ථාවෝචිත පරිදි, ඒ ප්‍රතික්ෂේප කිරීමට හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනය කරනු ලැබිය හැකි අතර, අභියාචනාධිකරණය විසින් කොමිෂන් සභාවේ තීරණය ස්ථිර කිරීම හෝ ඉවත ලෑම කරනු ලැබිය හැකි ය.

(5) (1) වන උපවගන්තිය යටතේ පනවන ලද තහනම, මේ වගන්තිය යටතේ බලපත්‍රයක් දරන්නකු විසින් සේවයෙහි නියුක්ත කරවනු ලබන්නා වූ තැනැත්තන් සම්බන්ධයෙන්, ඔවුන් විසින් කේබල් ඇදීමේ වැඩ කිරීමේ දී සහ බලපත්‍ර දරන්නාගේ අධීක්ෂණය යටතේ ඒ වැඩ කිරීමේ දී, ක්‍රියාත්මක නොවිය යුතු ය.

(6) මේ පනත යටතේ -

(අ) බලපත්‍රලාභියකු විසින් කේබල් ඇදීමේ වැඩ කරනු ලැබිය හැක්කේ යම් ස්ථාන තුළ ද නැතහොත්, යම් ස්ථාන මත ද ඒ ස්ථාන කවර වර්ග වලට අයත් ද යන්න නිශ්චිතව සඳහන් කරමින් ; සහ



(ආ) කේබල් ඇදීමේ වැඩ කිරීම සඳහා බලපත්‍රලාභියා විසින් සේවයේ නියුක්ත කරවනු ලැබ ඇති යම් තැනැත්තකුගේ වැඩ බලපත්‍රලාභියා විසින් අධීක්ෂණය කරනු ලැබිය හැකි ආකාරය නිශ්චිතව සඳහන් කරමින්

රීති සාදනු ලැබිය හැකි ය.''

ප්‍රධාන ප්‍රඥප්තියේ අලුත් IIඅ කොටස සහ IIආ කොටස ඇතුළත් කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22අ වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් කොටස් මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ඒ ප්‍රඥප්තියේ IIඅ කොටස සහ IIආ කොටස යනුවෙන් බලපැවැත්විය යුතු ය :-

"IIඅ කොටස

**කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය**

"විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්.

22ආ. (1) කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු (මේ පනතේ "අධ්‍යක්ෂ ජනරාල්වරයා, වශයෙන් සඳහන් කරනු ලබන) තැනැත්තකු අමාත්‍යවරයා විසින් විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා ගේ පාරිශ්‍රමික ද ඇතුළු සේවා නියුක්තියේ කොන්දේසි අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ සාමාන්‍ය විධාන යට සහ පාලනයට යටත්ව, කොමිෂන් සභාවේ කටයුතු සහ ගනුදෙනු මෙහෙයවීම, එහි බලතල හා කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම, කොමිෂන් සභාවේ සේවා නියුක්තයන් පිළිබඳ පරිපාලනය හා පාලනය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පැවරෙන්නේ ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, කොමිෂන් සභාවේ අනුමතය ඇතිව, මේ පනත මගින් තමා වෙත පැවරුණු හෝ නියම කෙරුණු යම් බලයක් හෝ කාර්යයක් යම් සේවා නියුක්තයකු වෙත පවරා දීම අවශ්‍ය යයි සලකන කවර විටක දී වුව ද එසේ කරනු ලැබිය හැකි අතර, ඒ සේවා

නියුක්තයා විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා ගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව, ඒ බලය හෝ කාර්යය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම, කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයා, අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය.

22ඇ. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාව විසින් –

(අ) කොමිෂන් සභාවේ බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම සඳහා අවශ්‍යයයි එය සලකන යම් නිලධරයන් සහ සේවකයන් පත් කරනු ලැබිය හැකි අතර, ඒ නිලධරයන් සහ සේවකයන් සේවයෙන් පහ කිරීම සහ ඔවුන් සම්බන්ධයෙන් විනය පාලනය කිරීම ;

(ආ) ඒ නිලධරයන්ට සහ සේවකයන්ට පාරිශ්‍රමික ගෙවිය යුත්තේ කවර අනුප්‍රමාණ අනුවදැයි නියම කිරීම ;

(ඇ) ඒ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සේවා නියම හා කොන්දේසි නිශ්චය කිරීම ; සහ

(ඈ) ඒ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ ප්‍රතිලාභය සඳහා අර්ථසාධක අරමුදල් හෝ යෝජනා ක්‍රම පිහිටුවා විධිමත් කිරීම, සහ ඒ අරමුදල්වලට කොමිෂන් සභාවේ අරමුදලින් දායක මුදල් ගෙවීම

කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සියලු කාරණා හෝ යම් කාරණය සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් රීති සාදනු ලැබිය හැකි ය.



කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට රජයේ සේවයේ නිලධරයන් පත් කිරීම.

22ඈ. (1) කොමිෂන් සභාවේ ඉල්ලීම පිට, 65ආ වගන්තිය හෝ 65ඇ වගන්තිය අදාළ වන රජයේ නිලධරයකු නොවන රජයේ සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, කොමිෂන් සභාව විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලයක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව හෝ ඒ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් හෝ පත් කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ යම් නිලධරයකු (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු, (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟවූ යම් තැනැත්තකු, කොමිෂන් සභාව විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් කොමිෂන් සභාවට සේවය කරනු ලබන යම් කාලයක් ඒ එකඟත්වයේ බැඳීම් ඉටු කර ලීමේ කාර්ය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

රාජ්‍ය සංස්ථාවල නිලධරයන් සහ සේවකයන් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.

22ඉ. (1) කොමිෂන් සභාවේ ඉල්ලීම පිට, රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ ඒ සංස්ථාවේ පාලක මණ්ඩලයේ කැමැත්ත ඇතිව, කොමිෂන් සභාව විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව, කොමිෂන් සභාව සහ ඒ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් එකඟවිය හැකි විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ නියම සහ කොන්දේසි ද ඇතුළු යම් නියම සහ කොන්දේසි මත කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට යම් තැනැත්තකු තාවකාලිකව හෝ ස්ථිරව පත් කරනු ලැබ ඇති අවස්ථාවක, ඔහු, කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු මෙන් එම විනය පාලනයට ම යටත් විය යුතු ය.

## IIආ කොටස

## කොමිෂන් සභාවේ අරමුදල

කොමිෂන් සභාවේ අරමුදල.

22ඊ. (1) කොමිෂන් සභාවට එය සතු අරමුදලක් තිබිය යුතු ය.

(2) පහත දැක්වෙන මුදල් කොමිෂන් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය :-

(අ) කොමිෂන් සභාවේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ;

(ආ) මේ පනතේ 17 වන, 21 වන සහ 22 වන වගන්ති යටතේ ගාස්තු වශයෙන් ගෙවනු ලැබිය හැකි සියලු මුදල් ;



(ඇ) 22උ වගන්තිය යටතේ පනවනු ලබන සෙස් බද්දෙන් ලැබෙන මුදල් ; සහ

(ඈ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත කවර වූ හෝ යම් ප්‍රභවයකින් පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් කොමිෂන් සභාව ලබන හැකි සියලු මුදල්.

(3) කොමිෂන් සභාව විසින්, එහි බලතල හා කාර්ය ක්‍රියාත්මක කිරීමේ දී හා කිරීමේ දී දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය වියහැකි යම්තාක් සියලු මුදල් ප්‍රමාණ කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

වාර්ෂික පිරිවැටුම මත සෙස් බද්ද පැනවීම.

22උ. (1) අමාත්‍යවරයා විසින්, මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි යම් අනුප්‍රමාණවලට අනුව වූ ක්‍රියාකරුගේ වාර්ෂික පිරිවැටුම මත වූ සෙස් බද්දක්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් පනවා අය කරනු ලැබිය හැකි අතර, එය ගෙවනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ නියම කරන ලද සෙස් බද්දේ ප්‍රමාණය එවැනි ම නියමයක් මගින් වෙනස් කරනු ලැබිය හැකි ය ; නැතහොත් පරිච්ඡින්න කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරන ලද සෑම නියමයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට හෝ එහි සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට බලාත්මක විය යුතු අතර, එය පළ කරන දින සිට මාස හතරක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද ඒ යම් නියමයක් එහි අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවක වලංගුතාවට ඉන් හානියක් නොමැතිව ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ නියම කරන ලැබූ සෙස් බද්ද වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පනවනු ලැබූ වෙනත් යම් බද්දකට හෝ සෙස් බද්දකට අතිරේකව විය යුතු ය.

මුදල් වර්ෂය.

22ඌ. කොමිෂන් සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

ගිණුම් විගණනය.

22ඒ. (1) කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් තබා ගැනීමට සැලැස්විය යුතු ය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, කොමිෂන් සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය ඉවත් කිරීම.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ අලුත් VIඅ කොටස ඇතුළත් කිරීම.

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ VIඅ කොටස වශයෙන් බලපැවැත්විය යුතු ය.

"VIඅ කොටස

විදුලි සංදේශ අධ්‍යක්ෂ විසින් කලින් ක්‍රියාත්මක කරන ලද සහ ඉටු කරන ලද බලධරයාගේ බලතල හා කාර්ය කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම.

65අ. නියමිත දිනට ඉහතින් ම වූ දින හෝ ඊට පෙර –

(අ) මේ පනතේ 24 වන වගන්තියෙන් ඉවත් කරන ලද පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 27(අ) වගන්තිය යටතේ බලධරයා විසින් යම් බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් ක්‍රියාත්මක කර, ඉටු කරනු ලැබ සහ කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ බලය, කර්තව්‍ය හෝ කාර්යය සියලු කාර්ය සඳහා නියමිත දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලද, ඉටු කරන ලද සහ කරන ලද ලෙස සලකනු ලැබිය යුතු ය :



(ආ) මේ පනතේ 24 වන වගන්තිය මගින් ඉවත් කරන ලද පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 27(ආ) වගන්තිය යටතේ යම් ලිඛිත නීතියක හෝ ලිඛිත නීතියකින් නියම කර ඇති හෝ බලය දී ඇති යම් දැන්වීමක හෝ වෙනත් ලේඛනයක හෝ ආකෘතියක, මේ පනතේ 4 වන වගන්තියෙන් ඉවත් කරන ලද පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය යටතේ පත් කරන ලද, (නමින් හෝ සම්පූර්ණ පදවි නාමයෙන් හෝ "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන සංක්ෂිප්ත පදවි නාමයෙන් වුව ද) විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්වරයා ගැන සඳහන් කරනු ලැබ ඇති සෑම අවස්ථාවකදීම "විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන වචන වෙනුවට "කොමිෂන් සභාව" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය.

අදාළ දිනයට පෙර බලධරයාගේ සේවයේ රජයේ නිලධරයකු විසින් දිනුම් නියමිත දැනුම්දීම.

65ආ. (1) නියමිත දිනට ඉහතින්ම වූ දින, ආණ්ඩුවේ ස්ථාන මාරුවීම් සහිත සේවයක යම් නිලධරයකු නොවන, බලධරයාගේ සේවයේ යෙදී සිටි සෑම රජයේ නිලධරයකුටම මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය අදාළ වන්නා වූ ද විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත යයි ප්‍රකාශිත තනතුරක් දරන්නා වූ ද සෑම රජයේ නිලධරයකු විසින් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි (මේ වගන්තියෙහි මෙහි මින් මතු "අදාළ දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයකට සති දෙකකට නොඅඩු කාලයකට පෙර, කොමිෂන් සභාව වෙත ලියවිල්ලක් මගින්, තමා ඒ දිනයට –

(අ) රජයේ නිලධරයකු වශයෙන් ධුරයේ නොකඩවා රැඳී සිටීමට ;

(ආ) විශ්‍රාම වැටුප් සහිත නිලධරයකු වශයෙන් ඒ දිනයට අවුරුදු දහයකට නොඅඩු විශ්‍රාම වැටුප් සහිත සේවයක් ඉටුකර තිබේ නම්, රජයේ සේවයෙන් විශ්‍රාම ගොස් කොමිෂන් සභාවේ සේවා නියුක්තයකු වීමට ; හෝ

(ඇ) විශ්‍රාම වැටුප් සහිත නිලධරයකු වශයෙන් ඒ දිනයට අවුරුදු දහයකට අඩු විශ්‍රාම වැටුප් සහිත සේවයක් ඉටුකර තිබේ නම්, රජයේ සේවයෙන් ඉවත් වී, කොමිෂන් සභාවේ සේවා නියුක්තයකු වීමට ; හෝ

(ඈ) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට, ඔහු දායකයකු වන්නේ නම්, රජයේ සේවයෙන් ඉවත් වී, කොමිෂන් සභාවේ සේවා නියුක්තයකු වීමට ; හෝ

(ඉ) රජයේ සේවයෙන් විශ්‍රාම ගොස් සහ ඉවත් වී, කොමිෂන් සභාවේ සේවා නියුක්තයකු නොවීමට

අදහස් කරන බව දැනුම් දිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ, බලධරයාගේ රජයේ නිලධරයකු විසින්, අදාළ දිනයට පෙර කොමිෂන් සභාව වෙත කරන ලද දැනුම්දීමක් අවසානාත්මක වන්නේ ය.

(4) බලධරයාගේ සේවයේ යෙදී සිටියා වූ ද, අදාළ දිනයට පෙර (2) වන උපවගන්තියේ (ආ), (ඇ), (ඈ), හෝ (ඉ) ඡේද යටතේ නියමිත



දැනුම්දීම නොකරන්නා වූ හෝ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ඒ දැනුම්දීම කරන්නා වූ ද රජයේ යම් නිලධරයකු ඒ දින සහ ඉන් පසුව රජයේ නිලධරයකු වශයෙන් දිගටම ධුරය දරන්නේ ය.

(5) (2) වන උපවගන්තියේ සඳහන් රජයේ නිලධරයකු ඒ ධුරයේ රැඳී සිටින තාක් කල් ඒ නිලධරයා වශයෙන් ඒ තත්ත්වයෙන්ම කොමිෂන් සභාව සඳහා සහ ඒ වෙනුවෙන් කටයුතු කරනු ලැබිය යුතු අතර, ඒ නිලධරයා වශයෙන් ඒ තත්ත්වයෙන්ම බලධරයා සඳහා කටයුතු කරන අතරතුර ඔහු හිමිකම ලැබූ සේවා කොන්දේසිවලට හිමිකම ලැබිය යුතු ය. තවද, වෙනත් යම් රජයේ නිලධරයකු මෙන්ම එම විනය පාලනයටම ඔහු යටත් විය යුතු ය.

(6) බලධරයාගේ සේවයේ යෙදී සිටි යම් රජයේ නිලධරයකු, අදාළ දින හෝ ඉන් පසුව, ඒ නිලධරයා වශයෙන් එම තත්ත්වයෙන්ම කොමිෂන් සභාව සඳහා සහ ඒ වෙනුවෙන් කටයුතු කරමින් ඒ නිලධරයා වශයෙන් ධුරයෙහි නොකඩවා කටයුතු කරන අවස්ථාවක, ඒ නිලධරයා සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් ගෙවනු ලැබිය යුතු විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදලට දායක මුදල් ද ඇතුළු වැටුප් සහ වෙනත් වියදම් පියවීම සඳහා ප්‍රමාණවත්, මුදලක් ලෙස, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයක් නොඉක්මවන යම් මුදලක් කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ අරමුදලින් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත ගෙවනු ලැබිය යුතු ය.

(7) බලධරයාගේ සේවයේ යෙදී සිටියා වූ ද අදාළ දිනට පෙර (2) වන උපවගන්තියේ (ආ) හෝ (ඇ) හෝ (ඈ) හෝ (ඉ) ඡේද යටතේ දැනුම්දීමක් කරනු ලබන්නා වූ ද රජයේ යම් නිලධරයකු විසින් –

(අ) ඔහු විසින් ඒ දැනුම්දීම ඒ උප වගන්තියේ (ආ) ඡේදය යටතේ කරන ලද අවස්ථාවක, අදාළ දින සිට සහ ඉන් පසුව කොමිෂන් සභාවේ සේවා නියුක්තයකු වන අතර, ඒ දින සිට ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූ ලෙස සැලකිය යුතු ය. තවද, ඔහු එදින ධූරය අහෝසි කිරීමේ හේතුව මත රජයේ සේවයෙන් විශ්‍රාම ලැබුවේ නම් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කළ යුතුව තිබූ, යම් විශ්‍රාම වැටුපකට ඔහු හිමිකම ලැබිය යුතු ය ; හෝ

(ආ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ඔහු විසින් ඒ දැනුම් දීම කරනු ලබන අවස්ථාවක, අදාළ දින සිට සහ ඉන් පසුව කොමිෂන් සභාවේ සේවා නියුක්තයකු වන අතර, (9) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සලස්වා ඇති පරිදි ඔහු අවුරුදු දහයක විශ්‍රාම වැටුප් සහිත සේවය සම්පූර්ණ කරන දිනයේ දී රජයේ සේවයෙන් ඉවත් වූ ලෙස සලකනු ලැබිය යුතු ය. තවද, විශ්‍රාම වැටුප් සහිත ඒ සේවා කාලය අවසන්වීමේ දී, ධූරය අහෝසි කිරීමේ හේතුව මත ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ලැබුවේ නම් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කළ යුතුව තිබූ, යම් ප්‍රදානයකට ඔහු හිමිකම ලැබිය යුතු ය ; හෝ

(ඇ) ඒ උප වගන්තියේ (ඇ) ඡේදය යටතේ ඔහු විසින් ඒ දැනුම්දීම කරනු ලබන අවස්ථාවක, අදාළ



දින සිට සහ ඉන් පසුව ඔහු කොමිෂන් සභාවේ සේවා නියුක්තයකු වන අතර, සේවයෙන් පහ කිරීමේ හේතුවෙන් නොව, ආණ්ඩුවේ කැමැත්ත ඇතිව, ඒ දිනයේ දී ගිවිසුමක් අවසන් කිරීමෙන් ඔහු ආණ්ඩුවේ සේවයෙන් ඉවත් වූ ලෙස රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය ; හෝ

(ඈ) ඒ උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ ඔහු විසින් ඒ දැනුම්දීම කරනු ලබන අවස්ථාවක —

(i) ඔහු ඒ උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් පන්තියට හෝ විස්තරයට අයත් රජයේ නිලධරයකු වේ නම්, අදාළ දිනයේ දී රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ දිනයේ දී ධූරය අහෝසි කිරීමේ හේතුව මත ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ලැබුවේ නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කළ යුතුව තිබූ යම් විශ්‍රාම වැටුපකට හිමිකම ලැබිය යුතු ය ;

(ii) ඔහු ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් පන්තියට හෝ විස්තරයට අයත් රජයේ නිලධරයකු වේ නම්, අදාළ දිනයේ දී රජයේ සේවයෙන් ඉවත් වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ දිනයේ දී ධූරය අහෝසි කිරීමේ හේතුව මත ඔහු රජයේ සේවයෙන් ඉවත්වූයේ නම් විශ්‍රාම වැටුප්

ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කළ යුතුව තිබූ යම් ප්‍රදානයකට හිමිකම ලැබිය යුතු ය.

(8) මේ වගන්තියේ (4) සහ (7) වන උපවගන්තිවල විධිවිධාන සහ මේ පනතේ වෙනත් යම් විධිවිධාන අතර යම් ගැටුමක් හෝ අනනුකූලතාවක් ඇතිවූ විටක දී, ඒ ගැටුමේ හෝ අනනුකූලතාවේ ප්‍රමාණයට ඒ උපවගන්තිවල විධිවිධාන ඒ වෙනත් විධිවිධාන අභිබවා බලපවත්වන්නේ ය.

(9) (7) වන උපවගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හේතුවෙන් අදාළ දිනයේ දී කොමිෂන් සභාවේ සේවා නියුක්තයකු බවට පත් වූ යම් සේවා නියුක්තයකුට සහ ඔහු සම්බන්ධයෙන් පහත දැක්වෙන විධිවිධාන අදාළ විය යුතු ය.–

(අ) ඒ සේවා නියුක්තයා, ඒ සේවා නියුක්තයා සහ කොමිෂන් සභාව අතර එකඟ විය හැකි යම් නියම සහ කොන්දේසි මත කොමිෂන් සභාව විසින් සේවයෙහි නියුක්ත කරවනු ලැබිය යුතු ය :

එසේ වුව ද, ඒ නියම හා කොන්දේසි බලධරයා විසින් ඒ සේවා නියුක්තයා කලින් සේවයේ නියුක්ත කරවන ලද නියම හා කොන්දේසිවලට වඩා අඩු වාසිදායක තත්ත්වයක නොතිබිය යුතු ය ;

(ආ) අදාළ දිනයේ දී ඒ සේවා නියුක්තයා විශ්‍රාම වැටුප් සහිත යයි ප්‍රකාශිත තනතුරක් දරමින් අවුරුදු දහයකට අඩු විශ්‍රාම වැටුප් සහිත සේවයක් තිබූ, බලධරයාගේ සේවයේ යෙදුනු රජයේ නිලධරයකු වූයේ නම්, එවිට –



(i) බලධරයා යටතේ ඔහුගේ විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයට යම් කාලයක් එකතු කළවිට, අවුරුදු දහයක සමස්ත විශ්‍රාම වැටුප් සහිත සේවා කාලපරිච්ඡේදයක් සම්පූර්ණ වන විටක, ඒ කාල පරිච්ඡේදය දක්වා ඔහු අදාළ දිනයේ දී, බලධරයාගේ සේවයේ දැරූ තනතුර දරමින් සිටි ලෙස විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යය සඳහා පමණක් සලකනු ලැබිය යුතු ය. (ඒ සමස්ත කාල පරිච්ඡේදය ආගණනය කිරීම සඳහා කොමිෂන් සභාව යටතේ සේවය බලධරයා යටතේ විශ්‍රාම වැටුප් සහිත සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.)

(ii) අදාළ දින ඔහු බලධරයා යටතේ දැරූ තනතුර යම් කාල පරිච්ඡේදයක් තුළ ඔහු දැරූ බවට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්ය සඳහා සලකනු ලබන විට, ඒ කාලපරිච්ඡේදයේ එක් එක් සම්පූර්ණ මාසය වෙනුවෙන් මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන මුදලක් ඔහු සම්බන්ධයෙන් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා කොමිෂන් සභාවේ අරමුදලින් කොමිෂන් සභාව විසින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය ;

(iii) (i) වන අනුඡේදයේ සඳහන් කාල පරිච්ඡේදය අවසානයේ දී ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ කාල පරිච්ඡේදය අවසානයේ දී තනතුර අහෝසි කිරීමේ හේතුව මත ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ලැබුවේ නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කළ යුතුව තිබූ යම් විශ්‍රාම වැටුපකට ඔහු හිමිකම ලැබිය යුතු ය.

(10) (අ) අදාළ දින හෝ ඉන් පසුව රජයේ නිලධරයකු වශයෙන් එම තත්ත්වයෙන් ම කොමිෂන් සභාව සඳහා සහ ඒ වෙනුවෙන් කටයුතු කරමින් ඒ රජයේ නිලධරයා වශයෙන් නොකඩවා ධුරයේ කටයුතු කරන යම් තැනැත්තකු, ඔහුගේ කැමැත්ත සහ කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව, කවර විටක දී වුව ද කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය හැකි ය.

(ආ) (අ) ඡේදය යටතේ යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබ ඇති අවස්ථාවක මේ වගන්තියේ (7) වන සහ (9) වන උපවගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු අතර, ඒ උපවගන්තිවල දැක්වෙන "අදාළ දිනය" සම්බන්ධයෙන් කර ඇති සඳහනෙන් නිලධරයා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබූ දිනය අදහස් වේ.



ස්ථාන මාරු කිරීම් සහිත සේවයක රජයේ නිලධරයකු කොමිෂන් සභාවේ සේවයේ නියුක්ත කරවීම.

65ඇ (1) නියමිත දිනට ඉහතින් ම වූ දින ආණ්ඩුවේ ස්ථාන මාරුවීම් සහිත සේවයක සිටි බලධරයාගේ යම් රජයේ නිලධරයකු, කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබ ඇති අවස්ථාවක, 65ආ වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයා සේවයෙහි නියුක්ත කරවීමට හා ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා 65ආ වගන්තියේ "අදාළ දිනය" සම්බන්ධයෙන් කර ඇති සඳහනෙන්, ඒ උපවගන්තියෙහි සඳහන් නිලධරයා කොමිෂන් සභාවේ සේවා නියුක්තයකු බවට පත්වූ දිනය අදහස් වේ.

"බලධරයා" යන යෙදුමෙහි අර්ථනිරූපනය

65ඈ. මේ පනතේ මේ කොටසේ කාර්යය සඳහා "බලධරයා" යන්නෙන්, මේ පනතේ 4 වන වගන්තිය මගින් ඉවත් කරනු ලැබ ඇති පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන උපවගන්තියෙහි සඳහන් බලධරයා අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 68අ, 68ආ, 68ඇ, සහ 68ඈ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ඒ ප්‍රඥප්තියේ 68අ, 68ආ, 68ඇ සහ 68ඈ වගන්ති වශයෙන් බල පැවැත්විය යුතු ය:-

කොමිෂන් සභාව සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත්කර ගැනීම.

68අ. (1) කොමිෂන් සභාවේ යම් කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම අවශ්‍ය වන්නා වූ සහ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්, යෝජිත අත්කර ගැනීම අනුමත කරනු ලබන්නා වූ ද අවස්ථාවක, ඒ දේපළ පොදු කාර්යයක් සඳහා අවශ්‍ය බව සැලකිය යුතු අතර, ඒ අනුව එය ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත් කර ගෙන කොමිෂන් සභාව වෙත පවරනු ලැබිය හැකි ය.

(2) කොමිෂන් සභාව සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම පිණිස ගෙවිය යුතු යම්

මුදලක්, කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

රජයට අයත් වංචල හා නිශ්චල දේපළ දෙවර්ගය ම කොමිෂන් සභාවට ලබාදීම.

68ආ (1) රජයේ යම් නිශ්චල දේපළක් කොමිෂන් සභාවේ කාර්ය සඳහා අවශ්‍යවන අවස්ථාවක, ඒ කාර්යය රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ ඒ දේපළ සම්බන්ධයෙන් විශේෂ ප්‍රදානයක් හෝ බද්දක් දෙනු ලැබිය හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, ඒ ආඥාපනතේ විධිවිධාන, කොමිෂන් සභාව වෙත දෙනු ලබන ඒ දේපළ පිළිබඳ විශේෂ ප්‍රදානයකට හෝ බද්දකට අදාළ විය යුතු ය.

(2) රජයේ යම් වංචල දේපළක් කොමිෂන් සභාවේ කාර්යය සඳහා අවශ්‍ය වන අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ඒ වංචල දේපළ පිළිබඳ සන්තකය සහ පරිහරණය කොමිෂන් සභාව වෙත පැවරීම සහ සතු කිරීම, කරනු ලැබිය හැකි ය.

සාමාජිකයන් නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් වශයෙන් සැලකිය යුතු බව.

68ඇ. කොමිෂන් සභාවේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාව උපලේඛනගත ආයතනයක් වශයෙන් සැලකිය යුතු බව.

68ඈ. කොමිෂන් සභාව අල්ලස් පනතේ අර්ථානු කූලව උපලේඛනගත ආයතනයක් වන අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කිරීම.

27. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය, "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන යෙදුම පිළිබඳ අර්ථකථනයට පෙරාතුව ම, පහත දැක්වෙන අලුත් අර්ථකථන ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"කේබල් ඇදීමේ වැඩ" යන්නෙන් ,-

(අ) ක්‍රියාකරුවකු විසින් ක්‍රියාත්මක කරනු ලබන විදුලි සංදේශ ක්‍රමයකට සන්ධි කිරීම සඳහා ග්‍රාහක කේබල් සවිකිරීම ;



(ආ) ක්‍රියාකරුවකු විසින් ක්‍රියාත්මක කරනු ලබන විදුලි සංදේශ ක්‍රමයකට ග්‍රාහක කේබල් සන්ධි කිරීම : හෝ

(ඇ) ක්‍රියාකරුවකු විසින් ක්‍රියාත්මක කරනු ලබන විදුලි සංදේශ ක්‍රමයකට සන්ධි කරන ලද ග්‍රාහක කේබල් නඩත්තු කිරීම

අදහස් වේ :

"ග්‍රාහක කේබල් ඇදීම" යන්නෙන් –

(අ) ක්‍රියාකරුවන් විසින් ක්‍රියාත්මක කරනු ලබන විදුලි සංදේශ ක්‍රමයකට සන්ධි කරනු ලබන හෝ සන්ධි කිරීමට අදහස් කරනු ලබන : සහ

(ආ) (අ) ඡේදයෙහි සඳහන් එවැනි යම් විදුලි සංදේශ ක්‍රමයක මායිම් ඉක්මවා පාවිච්චි කරන හෝ පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන

දුරකථන මාර්ගයක් අදහස් වේ ;".

ප්‍රධාන ප්‍රඥප්තියට උපලේඛනයක් එකතු කිරීම.

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපලේඛනය මෙයින් එකතු කරනු ලැබේ :-

"උපලේඛනය [3 (2) වන වගන්තිය]

කොමිෂන් සභාවේ පත් කළ සාමාජිකයන්ට අදාළ විධිවිධාන

1. යම් තැනැත්තකු –

(අ) පාර්ලිමේන්තු, මන්ත්‍රීවරයකු වේ නම් නැතහොත් හෝ පළාත් සභා පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ මන්ත්‍රීවරයකු හෝ සභිකයකු බවට පත් වේ නම් ; සහ

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම්,

කොමිෂන් සභාවට පත් කිරීමට හෝ එහි සාමාජිකයකු වශයෙන් කටයුතු කරගෙන යාමට ඔහු නුසුදුස්සකු වන්නේ ය.

2. කොමිෂන් සභාවේ සෑම පත් කළ සාමාජිකයකුම මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා කලින් ධුරය හිස් කරන්නේ නම් මිස ඔහු පත් කරනු ලැබූ දිනයේ සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර ධුරයෙන් ඔහුව ඉවත් කරනු ලැබ ඇත්තේ නම් මිස නැවත පත් කරනු ලැබීමට සුදුසු වන්නේ ය.

3. කොමිෂන් සභාවේ යම් පත් කළ සාමාජිකයකු –

(අ) ඔහු, 1 වන ඡේදයේ සඳහන් යම් නුසුදුසුකමකට යටත් වන්නා වූ අවස්ථාවක :

(ආ) ස්වකීය කාර්ය කිරීමට ස්ථිර වශයෙන් නොහැකි වන්නා වූ අවස්ථාවක : නැතහොත්

(ඇ) ස්වකීය කාර්ය කිරීමේ දී, අයුතු ක්‍රියාවක්, බරපතල විෂමාචාරයක් හෝ නොසැලකිල්ලක් ලෙස සැලකෙන යම් ක්‍රියාවක් හෝ දෙයක් ඔහු විසින් කරන ලද අවස්ථාවක,

ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

4. කොමිෂන් සභාවේ පත් කළ සාමාජිකයකු විසින් කවර විටක දී වුව ද ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත අමතන ලද ලිපියක් මගින් සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, අමාත්‍යවරයා විසින් ඒ ඉල්ලා අස්වීම ලියවිල්ලකින් පිළිගැනීමෙන් පසු එය බලාත්මක විය යුතු ය.

5. පත් කළ සාමාජිකයකු, කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ මතය අනුව ප්‍රමාණවත් වන්නේ යැයි සැලකෙන නිදහසට කරුණක් නොමැතිව පිළිවෙළින් කොමිෂන් සභාවේ රැස්වීම් තුනකට නොපැමිණෙන්නේ නම්, ඔහු සිය ධුරය හිස් කළා සේ සලකනු ලැබිය යුතු ය.

6. ධුරය හිස් කරන හෝ හිස් කරන්නේ යයි සැලකෙන, කොමිෂන් සභාවේ පත් කළ සාමාජිකයකු, ඔහු ධුරය හිස්කළ හෝ ඔහු ධුරය හිස් කරන ලදැයි සැලකෙන දිනයේ දී කොමිෂන් සභාව ඉදිරියේ තීරණයට භාජනව පවතින කවර වූ හෝ කාරණයක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වෙනුවෙන්, ධුරය හිස් කරන ලද ඒ දිනයේ පටන් අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් සඳහා සහභාගි නොවිය යුතු අතර, ඔහු සාමාජිකයකු වී සිටිය දී, පෞද්ගලිකව සහභාගි වූ කවර වූ හෝ කාරණයක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වෙනුවෙන් සහභාගි නොවිය යුතු ය.



7. කොමිෂන් සභාවේ පත් කළ සාමාජිකයකු මිය යන, ඉල්ලා අස්වන, ධුරයෙන් ඉවත් කරනු ලබන හෝ ධුරය හිස් කළ ලෙස සලකනු ලබන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් මේ පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඒ සාමාජිකයාට අනුප්‍රාප්ත වීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. ඒ සාමාජිකයා වෙනුවට පත් කරන ලද යම් තැනැත්තකු විසින් තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ඉකුත් නොවූ ධුර කාලය තුළ ධුරය දැරිය යුතු ය.

8. කොමිෂන් සභාවේ පත් කළ සාමාජිකයකු අසනීපවීම, දුබලතාවයකට පත්වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර වීම හේතු කොට ගෙන ස්වකීය කාර්ය කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඒ නොහැකියාව පිළිබඳව ලියවිල්ලකින් අමාත්‍යවරයා වෙත දැන්වීම ඒ සාමාජිකයාගේ යුතුකම වන්නේය. ඉක්බිතිව, අමාත්‍යවරයා විසින්, මේ පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන නිසි සැලකිල්ලට ගනිමින් ඔහු නොපැමිණි කාලය තුළ දී ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

29. නියමිත දින පටන් සහ ඉන් පසුව –

(අ) ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය යටතේ බලධරයාගේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් දෙන ලද සහ නියමිත දිනට පෙරාතුවම වූ දින බලාත්මකව පැවති සෑම බලපත්‍රයක්ම, සියලු කාර්ය සඳහා කොමිෂන් සභාවේ නිර්දේශය මත දෙන ලද බලපත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එවැනි සෑම බලපත්‍රයක්ම වලංගු සහ බලසහිත විය යුතු අතර, එහි කාලය ඉකුත්වන තුරු නොකඩවා බලාත්මකව පැවතිය යුතු ය ;

බලධරයා විසින් නිකුත් කරන ලද බලපත්‍ර, ඔහුට අයත් දේපළ, ඇතුළත් වූ ගිවිසුම්, කරන ලද නියම සහ පවරන ලද නඩු කොමිෂන් සභාවේ කටයුතු ලෙස සැලකිය යුතු බව.

(ආ) ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන හෝ 22 වන වගන්තිය යටතේ බලධරයා විසින් නිකුත් කරන ලදුව, නියමිත

දිනට පෙරාතුව ම වූ දින බලාත්මකව පැවැති සෑම බලපත්‍රයක් ම, සියලු කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එවැනි සෑම බලපත්‍රයක් ම වලංගු සහ බලයහිත විය යුතු අතර, එහි කාලය ඉකුත්වන තුරු නොකඩවා බලාත්මකව පැවතිය යුතු ය ;

(ඇ) නියමිත දින හෝ ඊට පෙරාතුව බලධරයාට අයිතිව තිබූ හෝ ඔහු සන්තකයේ තිබූ සියලු චංචල හෝ නිශ්චල දේපළ කොමිෂන් සභාව වෙත පවරනු ලැබිය යුතු අතර, කොමිෂන් සභාවේ දේපළ වශයෙන් සලකනු ලැබිය යුතු ය ;

(ඈ) බලධරයා විසින්, බලධරයා සමග හෝ ඔහු සඳහා ඇතුළත් වූ සියලු ගිවිසුම් සහ එකඟවීම්, කොමිෂන් සභාව විසින් හෝ ඒ සමග හෝ එය සඳහා ඇතුළත් වූ ගිවිසුම් සහ එකඟවීම් ලෙස සලකනු ලැබිය යුතු අතර, නියමිත දිනට ඉහතින්ම වූ දිනයෙහි පැවති බලධරයාගේ සියලු අයිතිවාසිකම්, වරප්‍රසාද, බැඳීම්, ණය සහ බැරකම්, කොමිෂන් සභාවේ අයිතිවාසිකම්, වරප්‍රසාද, බැඳීම්, ණය සහ බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඉ) නියමිත දිනට ඉහතින්ම වූ දින විනිශ්චයට භාජනව පවතින, බලධරයා විසින් හෝ බලධරයාට එරෙහිව පවරන ලද සියලු නඩු සහ වෙනත් නීති කෘත්‍ය, කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාවට එරෙහිව පවරන ලද නඩු සහ නීති කෘත්‍ය ලෙස සලකනු ලැබිය යුතු අතර, එවැනි සෑම නඩුවක් සහ නීති කෘත්‍යයක්ම, ඒ අනුව කරගෙන යාම සහ බලාත්මක කිරීම, කරනු ලැබිය හැකි ය ;

(ඊ) නියමිත දිනට ඉහතින්ම වූ දින හෝ ඊට පෙර, ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය යටතේ බලධරයා විසින් කරන ලද සෑම නියමයක්ම, කොමිෂන් සභාව විසින් කරන ලද නියමයක් ලෙස සලකනු ලැබිය යුතු ය ; තව ද,

(උ) ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය යටතේ බලධරයා විසින් සාදන ලද, නියමිත දිනට ඉහතින්ම වූ දින



බලාත්මකව පවතින සෑම රීතියක් ම, කොමිෂන් සභාව විසින් සාදන ලද රීති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, ඒ වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් ඒවා සංශෝධනය කරනු ලැබිය හැකි ය : නැතහොත්, පරිච්ඡින්න කරනු ලැබිය හැකි ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**30.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයක ම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා එවා ලබාගත හැකිය.